# My Aged Care

My Aged Care - ඕස්ට්‍රේලියානු රජය විසින් සපයනු ලබන අතර, එමගින් අදාළ පුද්ගලයන් හට ඔවුන්ගේ අවශ්‍යතාවන් වලට සරිලන පරිදි වඩාත් සුදුසු ආකාරයේ වැඩිහිටි සුරැකුම් සේවාවන්වෙත පිවිසීමට උපකාර කරනු ලබයි.

මේ සඳහා සුදුසුකම් ලැබීමට නම්, පහත කරුණු සපුරා තිබිය යුතු වේ:

වයස අවුරුදු 65ක් හෝ ඊට වඩා වැඩි වීම. (ඇබොරිජිනල් හෝ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසියෙක් නම් වයස අවුරුදු 50 ක් හෝ ඊට වඩා වැඩි විය යුතුය).

**තම නිවසේදී ලබා ගන්නා සේවා, සුරැකුම් නිවාස තුළදී ලබා ගන්නා කෙටි කාලීන සේවා සහ නේවාසික සුරැකුම් පහසුකම් සඳහා අදාළ ගාස්තු අය කරනු ලබයි.**

ඔබට ලබා ගත හැකි විවිධාකාර සුරැකුම් පහසුකම් පහතින් දක්වා ඇත:

## • තම නිවාසේදීම සපයා ගත හැකි ආධාරක සේවා

### CHSP: Commonwealth Home Support Programme (නිවස වෙත ආධාරක සේවාවන් සපයන පොදු රාජ්‍ය මණ්ඩලීය වැඩසටහන)

මෙම වැඩසටහන මූලික හෝ ප්‍රාථමික මට්ටමේ සුරැකුම් අවශ්‍යතා සපයනු ලබයි.

### HCP: Home Care Packages (ගෘහස්ථ සුරැකුම් පැකේජය)

මෙම පැකේජය සපයනු ලබන්නේ ඉහළ මට්ටමේ හෝ සංකීර්ණ වූ සුරැකුම් අවශ්‍යතා උදෙසාය. මට්ටම් සතරකින් සමන්විත වන මෙම පැකේජයන් හරහා එකිනෙකට වෙනස් අරමුදල් සංචිත පවත්වාගෙන යනු ලබයි. ගාස්තු සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා My Aged Care වෙතින් උපදෙස් ලබා ගන්න.

## • වැඩිහිටි සුරැකුම් නිවාසයක් තුළදී ලබා ගත හැකි සුරැකුම් පහසුකම්

### කෙටි කාලීන සුරැකුම් පහසුකම්

මෙය, තුන් ආකාරයක සුරැකුම් පහසුකම් වලින් යුක්ත වේ.

1. **තාවකාලික සුරැකුම්** - සහභාගී වන අය සහ රැක බලා ගන්නා අය අය සඳහා කෙටි කාලීන විවේකයක් නිදහස් වීමක් ලබාදීම
2. **සුව සලසන/ සවි වඩන සුරැකුම්** - එදිනෙදා කටයුතු වලදී මතු වන දුෂ්කරතාවයන් මැඩපැවැත්වීම හෝ එම දුෂ්කරතාවයන් මගින් සිදු වන බලපෑම අවම කිරීමට ආධාර කිරීම
3. **සංක්‍රාන්ති සුරැකුම්** - රෝහල්ගත කාලසීමාවෙන් පසු යළිත් ප්‍රකෘති තත්ත්වයට පත් වීම අරමුණු කොට ඇත.

### නේවාසික සුරැකුම්

තවදුරටත් සිය නිවෙස් තුළ ජීවත් විය නොහැකි, එදිනෙදා කටයුතු වලදී හෝ සෞඛ්‍ය කටයුතු සම්බන්ධයෙන් නිරතුරුවම උවටැන් අවශ්‍ය පුද්ගලයන් වෙනුවෙනි.

# My Aged Care

## කාර්යභාරය සහ වගකීම

## ජාතික ආණ්ඩුව

### My Aged Care සඳහා අරමුදල් සම්පාදනය

**නිවාස වෙත ආධාරක සේවාවන් සපයන වැඩසටහන යටතේ පහත දැක්වෙන පහසුකම් ඇතුළත් විය හැක.**

- පොදු රාජ්‍ය මණ්ඩලීය නිවාස ආධාරක වැඩසටහන (CHSP)
- නිවාස සුරැකුම් පැකේජය / ගෘහස්ථ සුරැකුම් පැකේජය (HCP)
- සුදුසුකම් ලත් සෞඛ්‍ය වෘත්තිකයන්ගේ සේවය (Allied health and therapies)
- ගෘහාශ්‍රිත කටයුතු සඳහා සහාය වීම: පෞද්ගලික උවටැන්, පිරිසිදු කිරීමේ කටයුතු සහ බඳු බාහිරාදිය මිලයට ගැනීම් ආදිය
- සමාජමය කටයුතු සඳහා සහාය වීම
- නිවාස නඩත්තු කිරීම
- ආහාර වේල් ලබා දීම සහ අනෙකුත් පෝෂ්‍යය සේවාවන් සැපයීම
- ප්‍රවාහන සේවා සැලසීම
- තාවකාලික සුරැකුම් පහසුකම්

**නේවාසික වැඩිහිටි සුරැකුම් සේවයෙහි ඇතුළත් වන්නේ:**

- නේවාසික වැඩිහිටි සුරැකුම් නවාතැන් සැපයීම
- ආහාර පාන ලබා දීම, රෙදිපිළි සෝදා දීම සහ සමාජමය ක්‍රියාවන්හි සහභාගී කරවීම
- ඔබගේ අවශ්‍යතාවන් හට සරිලන පරිදි; පෞද්ගලික, ශායනික සහ හෙද සත්කාර සේවා
- තාවකාලික සුරැකුම් පහසුකම්

## ප්‍රාදේශීය ආණ්ඩුව

### Cardinia Shire Council

**ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් වැඩිහිටියන් සඳහා මිත්‍රශීලී යැයි පිළිගත් පුරවරයක් වීම අප හට අභිමානයකි.**

**පදිංචිකරුවන් හට සෞඛ්‍ය සම්පන්නව, සතුටුදායක ලෙස සිය වියපත් ජීවිතය ගත කිරීමට සහාය වීම:**

- වියපත්, පදිංචිකරුවන් හට සෞඛ්‍ය සම්පන්නව, ක්‍රියාශීලි අයුරින්, සමාජ සම්බන්ධතාවයන් පවත්වා ගනිමින් සහ ප්‍රජාව තුළ පූර්ණ වශයෙන් සහභාගීත්වය ඇති කරවීම සඳහා සහාය වීම.
- අපගේ ජ්‍යෙෂ්ඨ පුරවැසි සමූහයන් සඳහා සහයෝගය ලබා දීම.
- පුළුල් පරාසයක ප්‍රජා කණ්ඩායම් සහ සංවිධානයන්හි නියෝජනය සමගින් Cardinia ජ්‍යෙෂ්ඨ පදිංචිකරුවන්ගේ ජාලය සත්කාරකත්වයෙන් පැවැත්වීම.
- උපකාරවත් විය හැකි ප්‍රයෝජනවත් තොරතුරු, මූලාශ්‍ර සහ අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම සහ බෙදා හදා ගැනීම.

# තරුණ පුද්ගලයින් සඳහා ගෘහාශ්‍රිත සහ ප්‍රජා සුරකුම් වැඩසටහන (HACC - PYP)

ආබාධිතව සිටිනා පුද්ගලයන් හට මෙම වැඩසටහන හරහා මූලික වශයෙන් ලබා දිය යුතු ආධාර ලබා දීමත්, නිවාස නඩත්තු සේවයත් යන සේවා ලබා දිම තුළින්, තවදුරටත් ඔවුන්ගේ නිවාස තුළදීම හැකි තරම් ස්වාධීනව ජීවත් වීමට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා සකස් කර දෙනු ලබයි.

## මේ සඳහා සුදුසුකම් ලැබීමට නම්, ඔබ:

- වයස අවුරුදු 65 කට වඩා අඩු වීම සහ යම් ආබාධිත තත්ත්වයකින් යුක්ත වීම හෝ ආබාධිත තත්ත්වයේ පසුවන අයෙකු රැක බලා ගැනීම හෝ
- ඇබොරිජිනල් සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසියෙක් නම් වයස අවුරුදු 50 කට වඩා අඩු වීම සහ යම් ආබාධිත තත්ත්වයකින් යුක්ත වීම හෝ ආබාධිත තත්ත්වයේ පසුවන අයෙකු රැක බලා ගැනීම සහ
- අවශ්‍ය සහායෙන් තොර වීම සහ මේ හා සමාන ආධාරක වැඩසටහන් වෙත යොමු නොවීම තුළින් තම ස්වාධීනත්වය අහිමි වීමේ අවදානමකින් යුක්ත වීම.

## ලබා ගත හැකි සේවාවන්:

- නිවාස තුළදීම ලබා ගත හැකි ආකාරයේ පෞද්ගලික සුරකුම්/ සත්කාර, ගෘහාශ්‍රිත සහාය සහ දේපළ - ඉඩකඩම් නඩත්තු කිරීම.
- ප්‍රවාහන පහසුකම්, විවිධ ක්‍රියාකාරකම් පැවැත්වීම සඳහා ඇති කණ්ඩායම් සමගින් සහ සම්බන්ධ කරවීම, ආහාරපාන ලබා දීමේ සේවා සහ තාවකාලික රැකබලගැනීම් යනාදී ප්‍රජා සේවාවන්.

## වැඩි විස්තර සඳහා:

**Cardinia Shire** කවුන්සිලය ඇතුළත ප්‍රාදේශීය මට්ටමින් ලබා ගත හැකි සහාය

HACC PYP වැඩසටහන සම්බන්ධයෙන් විමසීමට හෝ අයදුම් කිරීමට:
**Mecwacare South East Region Service -** ඇතුළත් කර ගැනීමේ කණ්ඩායම

දුරකථන අංකය : 03 8573 4980
ඊමේල්: intake@mecwacare.org.au

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

HACC PYP වැඩසටහන සඳහා අරමුදල් සම්පාදනයත් එහි කළමණාකාරිත්වයත් වික්ටෝරියානු සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

ඊමේල්: HACC-PYP@health.vic.gov.au
වෙබ්: https://www.health.vic.gov.au/home-and-community-care/hacc-program-for-younger-people

# සන්නිවේදන ලැයිස්තුව

| | | |
|---|---|---|
| **My Aged Care** | වැඩිහිටි පුද්ගලයන් හට ඔවුන්ගේ අවශ්‍යතා වලට සරිලන පරිදි, රජයේ අරමුදල් හරහා සැපයෙන යෝග්‍ය වැඩිහිටි සුරැකුම් සේවාවන් පිළිබඳව සොයා ගැනීමටත්, ඒවා වෙත යොමු වීමටත් උපකාර කරනු ලබයි. | **My Aged Care**<br>දුරකථන අංකය:1800 200 422<br>වෙබ් : [www.myagedcare.gov.au](http://www.myagedcare.gov.au) |
| **ප්‍රාදේශීය කවුන්සිලය** | විවිධ සේවාවන් සැපයීම, උත්සව සහ ක්‍රියාකාරකම් පැවැත්වීම තුළින් වියපත් වීමේ ක්‍රියාවලියට නිසියාකාරව මුහුණ දීමට සහාය වීම. යහපත් කායික සහ මානසික සෞඛ්‍ය තත්ත්වයන් පවත්වාගෙන යාම මගින් මෙන්ම, තමන් නිරුපද්‍රිතව සහ සුරක්ෂිතව සිටින්නේය යන සුවදායී හැඟීමෙන් යුක්තව, ප්‍රජාවත් සමග සම්බන්ධ වෙමින්, අන් අය හා සබඳතාවයන් පවත්වා ගෙන යාම ආදී පහසුකම් සැලසීම. | **Cardinia Shire Council**<br>දුරකථන අංකය: 1300 787 624<br>ඊමේල් : [ageingwell@cardinia.vic.gov.au](mailto:ageingwell@cardinia.vic.gov.au)<br>වෙබ් : [www.cardinia.vic.gov.au/ageingwell](http://www.cardinia.vic.gov.au/ageingwell) |
| **Local Care Finder Service සුරැකුම් සේවාවන් පිළිබඳව ප්‍රාදේශීය මට්ටමින් විමසීමේ සේවය** | Care Finder (සුරැකුම් පිළිබඳ විමසීමේ සේවය) යනු මුහුණට මුහුණලා සම්මුඛවී, නොමිළයේ ලබා ගත හැකි සේවාවක් වන අතර, එමගින් පුද්ගලයන් හට වැඩිහිටි සුරැකුම් වැඩසටහන් පිළිබඳව ප්‍රවේශමෙන් විමසා බැලීමටත්, එම වැඩසටහන් වෙත ප්‍රවේශ වීමටත් අවශ්‍ය සහාය ලබා දේ.<br><br>යම් පුද්ගලයෙක් හට තමන්ට අවශ්‍ය සේවාවන් පිළිබඳව දැන ගැනීමටත්, උපදෙස් ලබා ගැනීමේ සැසි සඳහා සහභාගී වීමටත්, ඔවුන් හට වැඩිහිටි සුරැකුම් වැඩසටහන් ඇගයීමේ ක්‍රියාවලිය මුළුල්ලේ අවශ්‍ය සහාය ලබා දීමත් වෙනුවෙන් Care Finder කණ්ඩායමේ සාමාජිකයෙක් අදාළ පුද්ගලයා සමගින් කටයුතු කරනු ලබයි.<br><br>මෙහි ලැයිස්තුගත සංවිධාන අතුරින් කුමන හෝ සංවිධානයක් අමතා සුරැකුම් පිළිබඳ විමසීමේ කණ්ඩායමේ සාමාජිකයෙක් හා සමගින් කථා කිරීමට අවශ්‍ය බව පවසන්න. | **Care Connect**<br>දුරකථන අංකය : 1800 940 633<br>ඊමේල් : [carefinderenquiries@careconnect.org.au](mailto:carefinderenquiries@careconnect.org.au)<br><br>**Monash Health**<br>දුරකථන අංකය : 03 9792 7747<br>ඊමේල් : [communitysupportoptions@monashhealth.org](mailto:communitysupportoptions@monashhealth.org)<br><br>**Wintringham**<br>දුරකථන අංකය : 03 9034 4824<br>ඊමේල් : [adviceandinfo@wintringham.org.au](mailto:adviceandinfo@wintringham.org.au) |